# ශ්‍රී ලංකාවේ ආදිම ආර්ය ජනාවාස හා සබැඳි පාරිසරික ලක්ෂණ

ලෝකයේ ආදිම ශිෂ්ටාචාරය ලෙස සැළකෙන මෙසපොතේමියා, මිසර හා හරප්පා යන ශිෂ්ටාචාර බිහිවී ඇත්තේ ගංගා ආශ්‍රිතවය. ශ්‍රී ලංකාවේ ද ආදිම ආර්ය ජනාවාස පිහිටුවා ගනු ලැබ ඇත්තේ ගංගා ආශ්‍රිතවය. ඉන්දියාවේ සිට මෙරටට පැමිණි මුල්ම ආර්ය කණ්ඩායම් තැන්තැන්වල ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ ජල බහුල බිම් පෙදෙස්වල බව මහාවංශ ටීකාව සඳහන් කරයි. මේ නිසාම රජරට පැවති ආදිතම ශිෂ්ටාචාරය දැනට හඳුන්වනු ලබන්නේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය නමිනි. රජරට ශිෂ්ටාචාරය එසේ හැඳින්වීමට හේතු වූ තවත් කරුණක් වූයේ මුලදී ගංගා අසල පදිංචි වී සිටි ජනයා පසුව ගංගා ජලය උපයෝගී කරගනිමින් නිපදවා ගත් වැව් ආදිය ආශ්‍රිතව ගම්බිම් පිහිටුවාගෙන කෘෂිකාර්මික ජීවිතයක් ගත කිරීමට පෙළඹුණු නිසයි.

හැඳින්වුණු මල්වතු ඔය අසබඩ බව මහාවංශයේ සඳහන් වේ. එහිම සඳහන් වී ඇති පරිදි උපතිස්සගම පිහිටා තිබුණේද මල්වතුඔයේ ශාඛාවක් වූ එකල ගම්භීර නදී නමින් හැඳින්වුනු කනදරා ඔය අසබඩය.

උරුවේලාගම පිහිටා තිබූ ප්‍රදේශය සොයාගැනීමට තුඩුදෙන ඉඟියක් මහාවංශයෙන්ම ලැබේ. එම කෘතියට අනුව එම ජනාවාසය පිහිටා තිබුණේ අනුරාධපුරයේ සිට පස්යොදුනක් බටහිර දෙසට වූ ස්ථානයකය. කලා ඔය මෝයට නුදුරින් රට උතුරේ පිහිටා ඇති පොම්පරිප්පු නම් ස්ථානයෙන් හමුවූ සෙල්ලිපියක් ඇසුරෙන් මෙම ජනපදය පිහිටා තිබූ ප්‍රදේශය හෙළි කරගත හැකිවේ. පී. ඩබ්ලිව්. නිකලස් මහතා පවසන්නේ එම ජනපදය කලාඔය මෝය අසල පිහිටා තිබූ බවය.

***"ඉන්දියාවේ සිට මෙරටට පැමිණි මුල්ම ආර්ය කණ්ඩායම් තැන්තැන්වල ජනාවාස පිහිටුවා ගන්නා ලද්දේ ජල බහුල බිම් පෙදෙස්වල බව මහාවංශ ටීකාව සඳහන් කරයි. මේ නිසාම රජරට පැවති ආදිතම ශිෂ්ටාචාරය දැනට හඳුන්වනු ලබන්නේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය නමිනි."***

මෙරට පැරණිම ආර්ය ජනාවාස පිහිටා තිබූ ස්ථාන පිරික්සා බැලීමෙන් එකල පැවති භූගෝලීය පරිසරය කොතෙක් දුරට එම ජනාවාස පිහිටුවා ගැනීමෙහිලා බලපා ඇත්දැයි සිතාගත හැකිය.

අපේ වංශකතාවට අනුව ඉන්දියාවේ සිට මෙරටට පැමිණි මුල් ආර්ය කණ්ඩායම් තම ජනාවාස පිහිටුවා ගනු ලැබුයේ තම්බපණ්ණි, අනුරාධගම, උපතිස්සගම, උදේනි, උරුවේල, විජිත, රාමගෝණ, දීඝවාපි හෙවත් දීඝායුගම හා රෝහණ හෙවත් මාගම නම්වූ ස්ථානවලය. දීපවංශයේ සඳහන් වී ඇති පරිදි තම්බපණ්ණි නම්වූ ජනාවාසය පිහිටුවා ගනු ලැබුයේ නදී තීරයකය. පී.ඩබ්ලිව්. නිකලස් මහතාගේ මතය අනුව මෙය පිහිටුවා තිබුනේ මල්වතු ඔය මෝයට නුදුරු දැනට අරිප්පු නමින් හැඳින්වෙන ස්ථානයේය.

එහෙත් එමර්සන් ටෙනන්ට් හා ඊ. විජේසේකර මහතුන් විසින් ජනප්‍රවාද ඇසුරෙන් සකස් කරන ලදුව ඔවුන්ගේ මහාවංශ සිංහල පරිවර්තනයේ ඇතුළත් කොට ඇති පුරාතන ශ්‍රී ලංකාවේ සිතියමට අනුව තම්බපණ්ණි නගරය හෙවත් තම්මැන්නා නුවර පිහිටා තිබුණේ පුත්තලමට මදක් උතුරින් වූ මී ඔය මෝය අසලය. එසේම අනුරාධගම පිහිටුවා ගනු ලැබූයේ එකල කදම්බ නදිය නමින්

මහා වංශයේ සඳහන් වන දීඝායුගම හෙවත් දීඝවාපි ජනපදයද විජිතගාම හෙවත් විජිතපුරය ද පිහිටා තිබුණේ කලාඔය අසබඩ බව පෙන්වන පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාධක කිහිපයක්ම අපට ලැබී ඇත. පස්වැනි කාශ්‍යප රජුගේ (914 - 923) දම්පියා අටුවා ගැටපදය එහි මූලික කෘතිය වන ධම්මපදට්ඨ කථාවේ සූකරපෝතිකාය වත්ථුවෙහි එන "දීඝවාපරට්ඨෙ මහාමුනි නාම ගාමෙ" යන පාඨයට අර්ථ සපයා ඇත්තේ කළුදිගු කුළුවේ හෙවත් කළුදිගු කුලියේ මහමුනි නම් ගම යනුවෙනි. කලාඔය හා මී ඔය අතර ප්‍රදේශයේ එකිනෙකට නුදුරුව පිහිටා ඇති ස්ථාන තුනකින් එනම් පුත්තලම් දිස්ත්‍රික්කයේ ඉහතිම්ටිය, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුල්ගම හා ගල්ටැම්පට යන තැන්වලින් ලැබී ඇති දහවන සියවසට අයත් ටැම්ලිපි තුනක එම ස්ථාන කළුදිගුකුලිය නම්වූ දිස්ත්‍රික්කයකට අයත්වූ බව කියවේ. ඉහතින් සඳහන් කරුණු මහමුනි නම් ගම දැනට හැඳින්වෙන්නේ මහම්නියාව නමිනි. රිටිගලට සැතපුම් තුනක් පමණ බටහිරින් පිහිටා ඇති මෙම ගමේ ඇති පුරාණ විහාරය දනුදු හැඳින්වෙනුයේ මහමුණි අරම නමිනි. අනුරාධපුර යුගයේ මුල් කාලයේදී ද මෙම ප්‍රදේශය එනම් කලාඔය අසබඩ





ඡායාරූප: එම්. ඒ. එස්. එල්. ද. කොස්තා

"වැවයි දගැබයි" සංකල්පය මුල්කොට ගනිමින් ........



ප්‍රදේශය හඳුන්වනු ලැබ ඇත්තේ ද මෙනම්ති. අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චි කෝරලයේ කලාඔයට සැතපුම් තුනක් පමණ උතුරින් රිටිගලට නුදුරින් පිහිටා ඇති තුඹුල්ලෙගල නම් ස්ථානයේ ඇති භාතිකතිස්ස රජුගේ (ක්‍රි.පූ. 19-ක්‍රි.ව.9) කාලයට අයත් සෙල්ලිපියක 'කළදිනවිතකරිය' නම් ස්ථානයක් ගැන සඳහන් වී ඇති අතර, තුඹුල්ලගලට සැතපුම් දහයක පමණ බටහිරින් කලාඔයට සැතපුම් හතරක් පමණ දකුණින් පිහිටා ඇති මලස්නෙගල නම් ගමේ ඇති 3 වැනි සියවසට අයත් පර්වත ලිපියක 'කළදිනෙවි-නියමතන' නම්වූ ස්ථානයක් ගැනද සඳහන් වේ. සී. ඩබ්ලිව්. නිකලස් මහතා මේ ස්ථාන දෙකම පිහිටා තිබෙන්නට ඇත්තේ කලාඔය ආසන්නයේ බව පවසයි.

මහාවංශයේ හා සහස්සවත්ථුප්පකරණයේ එන වේළුසුමන යෝධයාගේ කථාපුවතට අනුව දිගාවැව පිහිටා තිබුණේ රෝහණ ජනපදයේ අගනුවර වූ මාගමට සැතපුම් කිහිපයක් උතුරෙනි. උදසනින් නැගිට පාගමනින් මාගම සිට අනුරාධපුරය බලා ගිය වේළුසුමන යෝධයා දිගාවැවේ දී උදේ ආහාරය ගත් බවත් පසුව එතැනින් නික්ම ගොස් මහාගංගා නම් නදියක වඩමන්නාතොට නම්වූ තොටකින් එතෙරව සවස් වරුවේම අනුරාධපුරයට ළඟා වූ බවත් සහස්සවත්ථුප්පකරණයේ සඳහන් වේ. මෙම කෘතියෙහිම එන මහානෙලවත්ථුවෙහි සඳහන් තොරතුරු වලින් ද හෙළිවන්නේ මාගමට උතුරින් ඊට සැතපුම් කිහිපයක් ඈතින් දිගාවැව ජනාවාසය පිහිටා තිබූ බව හා දිගාවැවට උතුරින් ගංගා නමින් හැඳින්වුණු ගංගාවක් පිහිටා තිබූ බවයි. මනෝරථපූරණියට අනුව දිගාවැව පිහිටා තිබුණේ මාගමට යොදුන් නවයක් හෙවත් සැතපුම් 50 ක් පමණ ඈතිනි. උදසන මාගමින් පිටත්වූ මහානේල යෝධයාට මධ්‍යාහ්නයටත් පෙර දිගාවැව හා වඩමන්නාතොට හරහා අනුරාධපුරයට යා හැකි වූ බව සහස්ස වත්ථුවේ සඳහන් වේ.

මෙම තොරතුරු වලට අනුව එකල දීඝවාපී නමින් හැඳින්වුණු ජනාවාසය කලාඔය ආශ්‍රිතව විශාල ප්‍රදේශයක පැතිරී තිබූ බව හා මාගම හෙවත් රෝහණ ජනපදය අනුරාධපුරයට සමීප ස්ථානයක පිහිටා තිබූ බවද පැහැදිලිය. ක්‍රි.ව. දෙවැනි සියවසේ මුල් භාගයට අයත් ටොලමිගේ ලංකා සිතියමේ අනුරාධපුරය හා මාගම යන ස්ථාන එකට එක්ව තරමක් නුදුරින් පිහිටා තිබූ බවය. මිහින්තලේ චේතියගිරි විහාරයේ විසූ දීඝභාණක මහා අභය නම් තෙරුන් විසින් මාගමදී පවත්වනු ලැබූ ධර්ම දේශනාවක් ශ්‍රවණය කරනු පිණිස මාගම වැසියන් හැමදෙනෙකුම පාගේ එහි රැස්වූ බවත් උන්වහන්සේ ධර්ම දේශනාවෙන් පසු එදැරුම පෙරළා පාගමනින්ම මිහින්තලයට වැඩි බවත් පපංචසූදනියේ එන කථා පුවතකින් හෙළිවේ. මෙම පුවතින් හෙළිවන්නේත් මාගම හා අනුරාධපුරය අතර වූ දුර ප්‍රමාණය එතරම් විශාල නොවූ බවයි.

ටොලමිගේ ලංකා සිතියමට අනුව රෝහණ ජනපදයේ අගනුවර වූ මාගම පිහිටා තිබුණේ හැංජීස් හෙවත් ගංහා හෝ මහගංගා යනුවෙන් හැඳින්වුණු ගඟක වම් ඉවුරේය. පොළොන්නරුවෙන් ලැබුණු දහවැනි සියවසට අයත් ටැම්ලිපියක ඇළසර හෙවත් ඇළහැර පිහිටා තිබුණේ මහාගංගා නම් නදියක් අසබඩ බව සඳහන් වේ. ඇළහැර පිහිටා ඇත්තේ මහවැලි ගඟේ ප්‍රධාන ශාඛාව වූ අඹන්ගඟේ වම් ඉවුරේය. මෙහි පුරාණ නගරයක නටඹුන් අද පවා දැකිය හැකිය. මේවා පැරණි මාගම නගරයේ නටඹුන් වශයෙන් හඳුනාගත හැකිය. මේ අනුව පුරාණ රෝහණ ජනපදය අඹන්ගඟ ආශ්‍රිතව පිහිටුවා ගන්නා ලද බව පැහැදිලිය. දැනට පුරාණ මාගම නගරය වශයෙන් හඳුනා ගන්නා තිස්සමහාරාම ප්‍රදේශයේ රුහුණේ අගනුවර පිහිටුවා ගනු ලැබ ඇත්තේ ක්‍රි.ව. අටවැනි සියවසේ අග හරියේදී බවට සාක්ෂි ඇත.



පරිසරය හා සබැඳුනු සංස්කෘතියක් ......

ඡායාරූප: අරුණ පී. අතුකෝරළ

දීඝවාපී හා රෝහණ ජනපද මෙන්ම විජිතගාම නමින් පිහිටුවා ගත් ජනාවාසයද ගංහාවක් අසබඩ පිහිටුවා ගත් බව මහාවංශයේ හා එහි ටීකාවේ සඳහන් වී ඇති තොරතුරු කිහිපයක් මගින් හෙළිවේ. විජය රජුගේ ඇවෑමෙන් රාජ්‍යයට පත්ව අනුරාධපුරයට මදක් උතුරින් පිහිටා තිබූ උපතිස්සගම සිට රාජ්‍යය විචාල පඬුවස්දෙව් රජුගේ බිසෝ තනතුරට පත්වීම සඳහා ඉන්දියාවේ සිට නැව් නැගී මෙහි පැමිණ මාකඳුරුඔය(මහාකන්දර නදී) මෝය අසල පිහිටා තිබූ ගෝණගම්පටුනෙන් ගොඩ බට භද්දකච්චානා කුමරිය හා පිරිස එහි සිට විජිත නගරය හා අනුරාධපුරය හරහා ගොස් උපතිස්සගමට ලඟා වූ බව මහාවංශ ටීකාවේ සඳහන් වේ. මහාකන්දර නදිය යනුවෙන් එකල හැඳින්වුණු නදිය දැනට හැඳින්වෙන්නේ මහඔය හෙවත් මාකඳුරු ඔය නමිනි. එය පිහිටා ඇත්තේ මීගමු කොච්චිකඩේට නුදුරුවය. කොච්චිකඩේ ප්‍රදේශයේ සිට අනුරාධපුරයට යන අයෙකුට අනිවාර්යයෙන්ම දැදුරුඔය, මී ඔය හා කලා ඔය හරහා එහි යාමට සිදුවේ. ඒ අනුව විජිතපුරය පිහිටා තිබිය යුත්තේ අනුරාධපුරය හා කොච්චිකඩේ අතර ප්‍රදේශයකය. විජිතපුරය නමින් දන්නා පැරණි ගමක් කලා වැවට ආසන්නව ඊට බටහිරින් හා කලා ඔයට මදක් උතුරින් ගලේවෙල සිට අනුරාධපුරයට යන මහා මාර්ගය අසල පිහිටා ඇත. ජනප්‍රවාදයට අනුව මෙය පුරාණ විජිතපුරය බව කියැවේ. එබැවින් කලාඔයේ උතුරු ඉවුරේ පිහිටා ඇති විජිතපුරය එකල විජිතගම නම්වූ ජනාවාසය පිහිටා තිබූ ස්ථානය බව නිසැකය.

ඉතිරි ජනාවාස දෙක වන රාමගෝණ හා උදේනිගම පිහිටා තිබුණේ කුමන ගංගාවක් අසබඩ ද යන්න සොයා ගැනීමට ඉවහල් වන තොරතුරු කිසිවක් වංශකථා වලින් හෝ පුරාවිද්‍යා මූලාශ්‍ර වලින් හෝ නොලැබේ. එහෙත් මෙම ජනාවාස දෙකද අනුරාධපුරයට බටහිරින් හෝ නිරිත දෙසින් පිහිටා ඇති ගඟක් ආශ්‍රිතව බිහිවන්නට ඇතැයි අනුමාන කළ හැකිය. කනිට්ඨතිස්ස රජු (167 - 186) විසින් රාමගෝණ නම් ගමක විහාරයක් (රාමගෝණක විහාරය) කරවන ලද බව මහාවංශයේ සඳහන් වේ. මහාවංශයට අනුව මෙය පිහිටා තිබුණේ අනුරාධපුරයෙන් බටහිර ප්‍රදේශයේය. අනුරාධපුරයේ සිට යොදුන් පහක් පමණ දුරින් පිහිටා තිබූ ගෝණගාම නම් ස්ථානයක් ගැන රසවාහිනියේ කියැවේ. එහි අනුකරණයක්





වන සද්ධර්මාලංකාරයට අනුව මේ ගෝණගම පිහිටා තිබුණේ ගංමෝයක් අසලය. මේ අනුව ශ්‍රී ලංකාවේ මුල් ජනාවාස සියල්ලම පාහේ පිහිටුවීමෙහිලා ජලාශ්‍රිත පරිසරය බලපා ඇති බව අප මෙතෙක් කරන ලද විමසුමෙන් පැහැදිලි වේ. මෙහිලා තවත් බලපෑ පාරිසරික ලක්ෂණයක් වූ බව පෙනෙන්නේ පිටරටවල් හා සම්බන්ධකම් පැවැත්වීමට හැකිවූ වරායයන් හෝ පටුනු එම ජනාවාස බිහිවූ ප්‍රදේශ අසල පිහිටා තිබීමයි. අප ඉහතින් සඳහන් කළ තම්බපණ්ණි හා උරුවේල යන ජනපද පිහිටුවා ගනු ලැබ ඇත්තේ එවැනි පටුන් අසලය.

අප කලින් සඳහන් කළ පුරාතන ජනාවාස රට අභ්‍යන්තරයට පැතිරීයාමෙන් පසු ඒවා ආශ්‍රිතව තවත් කුඩා ජනාවාස බිහිවන්නට විය. මේවා බිහිවී ඇත්තේ ද ජලාශ ආශ්‍රිතවය. එනම් ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබාගැනීම සඳහා ඉදිවූ වැව් ආශ්‍රිතව බව පෙනේ. බොහෝවිට එම ජනාවාස එම වැව්වල නමින්ම ප්‍රසිද්ධියට පත්විය. උදහරණයක් වශයෙන් කලා වැව, මින්නේරිය, මහව, කවුඩුල්ල ආදී වැව් ආශ්‍රිත ජනාවාස දක්විය හැකිය. තවත් මෙවැනි කුඩා ජනාවාස හඳුන්වා ඇත්තේ වාපි, වාවී, කුලිය යනුවෙනි. දම්පියා අටුවා ගැටපදය දීඝවාපී යන්න සමකොට ඇත්තේ දිගෑකුලිය වශයෙනි. අම්ගම්කුලිය, බිතුරේවතු කුලිය, කළුදිගෑකුලිය, මහදෙමටකුලිය, පරිසාකුලිය, යගුලා කුලිය ආදීවූ නම් වලින් හැඳින්වුණු වැව් ආශ්‍රිතව පිහිටා තිබූ ජනාවාස දහසයක පමණ නම් නවවැනි හා දහවැනි සියවස් වලට අයත් සෙල්ලිපි කිහිපයකින් හෙළිවේ. වැව් ආශ්‍රිතව පිහිටා තිබූ මෙවැනි ඇතැම් පැරණි කුඩා ජනාවාස දනට හඳුන්වනු ලබන්නේ 'කුලම්' යනුවෙනි. පෙරිය කුලම් (මහ වැව) පුලියන්කුලම් (සියඹලා වැව) ආදී වූ පැරණි වැව් ආශ්‍රිතව පිහිටා තිබූ මෙවැනි කුඩා ජනාවාස විශාල සංඛ්‍යාවක් රජරට පිහිටා තිබූ බවට එම ප්‍රදේශයේ අහලේ සිතියම් දක්වයි.

අප මෙතෙක් ගෙනහැර පෑ තොරතුරු සමාලෝචනය කිරීමේදී පැහැදිලිව පෙනීයන්නේ මෙරට භූගෝලීය පාරිසරික ලකෂණ මෙහි ආදිම ජනාවාස බිහිවීමෙහිලා බොහෝදුරට බලපා ඇති බවයි.

**මහාචාර්ය සිරිමල් රණවැල්ල**

**ආසියානු රටවල් කීපයක වර්ග කිලෝ මීටර් 10,000ක ඇති ජීවීන් විශේෂ සංඛ්‍යාව**

| රට | ක්ෂීරපායීන් | උභය ජීවීන් | පක්ෂීන් | උරගයින් | සපුෂ්ප ශාක |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 13.1 | 5.8 | 36 | 22 | 485 |
| මැලේසියාව | 09.0 | 5.2 | 37 | 09 | 470 |
| වියට්නාමය | 06.1 | 2.2 | - | - | 355 |
| පිලිපීනය | 05.5 | 2.6 | 18 | - | 290 |
| තායිලන්තය | 05.25 | 2.0 | 16 | - | 240 |
| මියන්මාරය | 04.5 | 1.1 | 15 | 04 | 100 |
| ඉන්දුනීසියාව | 03.0 | 1.5 | 09 | 03.5 | 105 |
| ඉන්දියාව | 01.25 | 0.6 | 04 | 02 | 50 |
| චීනය | 0.5 | 0.4 | 01.5 | 0.5 | 30 |

*මූලාශ්‍රය: වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක් ඇසුරෙනි.*

# ඕසෝන් ගීතය

පවසන්නම් ඔබට - ඕසෝන් වියන ගැන
සවන් දෙන්න මට එහි මහ ඇතයි මහ ඉහළයි
ජෙට් යානාවට හා - වළාකුළු වලට වඩා
සුරකී මිහිතලයේ - කඳුළැලි රැකගැනුමට ජීවය දසතින්
හා හා කෙතරම් අසිරිමත් ද එය මැනවින්

පවසන්නම් ඔබට - ඕසෝන් වියන ගැන
වනන්තරේ සිට අහසට ඇදෙනා සුළිං රැළි
තුති වේ හිරු සඳුටත් සුළං රැළි වලට ඉතා
උපදී කිරිකැටි ඕසෝන් එහි රැක ගැනුමට ජීවය දසතින්
හා හා කෙතරම් අසිරිමත්ද එය මැනවින්
ඕසෝන් /// වියන

පවසන්නම් ඔබට - ඕසෝන් වියන ගැන
තුරන් කරයි හිරුගේ විස කිරණින් මිහිතලයේ
සුවදායක වේ එය ඔබටත් - අපටත් ඉතා
සුරකී අප හෙට දින - නිසිලෙස රැක ගැනුමට ජීවය දසතින්
හා හා කෙතරම් අසිරිමත් ද එය මැනවින්

කුමක් වේද නැතිව - ඕසෝන් වියන ලොව
කෘමි පෙළ කුසුම්ද මින් රළ දිවි නොගෙවතිය තොසේ
තල්මසුන් රෝසමල් - බිහු කැළ යයි වැනසී
මියැදේ මහ පොළොවේ - සරු දිවි රැක ගැනුමට දසතින්
හා හා කෙතරම් අසිරිමත් ද එය මැනවින්
ඕසෝන් /// වියන

පවසන්නම් ඔබට - ඕසෝන් වියන ගැන
ඇතැම් දේ අපහට සකසන්නට බැ තනිව
පතුරවමු අපි හදවතින්ම සම කරුණා
සුරකී අප හෙට දින - නිසිලෙස රැක ගැනුමට ජීවය දසතින්
හා හා කෙතරම් අසිරිමත් ද එය මැනවින්

ඕසෝන් ඔබට ආයු බොහෝ වේවා
ඔබත් රැකී විශ්වයම රකිනු මැන වොරැදී
දිදුලන ඔබ සැමතින් සුරකිනු මැන එ සදා
සුරකී අප හෙට දින - නිසිලෙස රැක ගැනුමට ජීවය දසතින්
හා හා කෙතරම් අසිරිමත් ද එය මැනවින්
ඕසෝන් /// වියන

**2000.09.16 වැනි දින පැවැති ඕසෝන් දින උත්සවයේදී**
**කොළඹ - මියුසියස් විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ**
**සිසුවියන් විසින් ගායනා කෙරිනි.**
**ජාත්‍යන්තර ඕසෝන් ගීතයට අනුව සිංහල පදමාලාව රචනා කළේ**
**සන්ධ්‍යා විජයබණ්ඩාර**
**අධ්‍යක්ෂ (ප්‍රවර්ධන හා පරිසර අධ්‍යාපන)**

